**ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය - 2017**

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (ජාජසජම) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**
**------------------**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**
**---------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**
**------------------------------------------**

**2.2.1** **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර) අනුකූලවීම**
**-----------------------------------------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** **ශ්‍රීලංගිප්‍ර 01 - මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
ප්‍රමිතයෙහි ඡේද අංක 32ට පටහැනි ලෙස එකතුව රු.5,347,682 ක් වූ වර්ෂ තුනකට වඩා වැඩි කාලයක සිට පැවත එන වෙනත් ණය හිමි ශේෂයන් අනාගතයේදී ඇති විය හැකි වගකීම් පිළිබඳව හඳුනාගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී වෙනත් ආදායමට මාරු කර තිබුණි.

**(ආ)** **ශ්‍රීලංගිප්‍ර 16 - දේපල, පිරියත හා උපකරණ**
පිරිවැය ආසන්න ලෙස රු.526,264,886 ක් වූ සම්පූර්ණයෙන්ම ක්ෂය කරන ලද වත්කම් ඒවායේ ඵලදායී ආර්ථික ජීවිත කාලය පිළිබඳව නැවත තක්සේරු කිරීමකින් තොරව හා ප්‍රමිතයෙහි විධිවිධාන අනුව ගිණුම්ගත කිරීමකින් තොරව මණ්ඩලය විසින් අඛණ්ඩව භාවිතා කරනු ලබයි.

**(ඇ)** **ශ්‍රීලංගිප්‍ර 19 - සේවක ප්‍රතිලාභ**
සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුල ප්‍රමිතයෙහි ඡේද අංක 58 හා 59 ප්‍රකාරව විශ්‍රාම ප්‍රතිලාභ බැදීම් ( පාරිතෝෂික ප්‍රතිපාදන) සඳහා වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

**(ඈ)** **ශ්‍රීලංගිප්‍ර 20 - රජයේ ප්‍රදාන ගිණුම් ගත කිරීම හා රජයේ ආධාර හෙළිදරව් කිරීම**
වර්ෂ 07 සිට වර්ෂ 11 කට වැඩි කාලයක් නොවෙනස්ව පැවති ව්‍යාපෘති 33 කට අදාල එකතුව රු. මිලියන 14,498 ක් වූ විදේශ ප්‍රදාන ශේෂයන් ක්‍රමක්ෂය කිරීමෙන් තොරව අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබුණි. එම විදේශ ප්‍රදාන සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු කිසිවක් නොමැති වීම හේතුවෙන් ක්‍රමක්ෂය නොකිරීම මත මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම විගණනයේදී තහවුරු කළ නොහැකිවිය.

**(ඉ)** **ශ්‍රීලංගිප්‍ර 23 - ණය ගැනුම් පිරිවැය**
ප්‍රමිතයෙහි ඇතුළත් ප්‍රතිපාදනයන්ට පටහැනි ලෙස රු. බිලියන 3.5 ක දේශීය ණය යටතේ දියත් කරන ලද ව්‍යාපෘතීන්ට අදාළව සම්පූර්ණයෙන්ම වැඩ අවසන් කරන ලද කොන්ත්‍රාත් හතරක (4) ක රු. 3,922,080 ක් වූ ණය ගැනුම් පිරිවැය 2016 හා 2017 වර්ෂයන්හිදී ප්‍රාග්ධනිත ගත කර තිබුණි.

(ඊ) **ශ්‍රීලංගිප්‍ර 38 - අස්පෘශ්‍ය වත්කම්**

ප්‍රමිතයෙහි 104 වැනි ඡේදයෙහි නියමකර ඇති පරිදි අස්පෘශ්‍ය වත්කම්හි ක්‍රමක්ෂය කාල පරිච්ඡේදය හා ක්‍රමක්ෂය ක්‍රමය ඒ ඒ මූල්‍ය වර්ෂය තුළදී හෝ සමාලෝචනය කිරීමට මණ්ඩලය අපොහොසත් වී තිබුණි.

(උ) **ශ්‍රීලංගිප්‍ර 40 - ආයෝජන දේපල**

(අ) ධාරණ අගය රු. මිලියන 347.30 ක් වූ ආයෝජන දේපල 2017 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුළ වෙනම දක්වා නොතිබුණි.

(ආ) ප්‍රමිතයෙහි ඡේද අංක 79 ප්‍රකාරව ක්ෂය ක්‍රමය, ඵලදායී ජීවිත කාලය හෝ ක්ෂය අනුපාතය දළ ධාරණ වටිනාකම සහ කාලච්ඡේදයේ ආරම්භක හා අවසාන දිනට සමුච්චිත ක්ෂය සහ අපහායන වටිනාකම ආදිය සම්බන්ධයෙන් මණ්ඩලය විසින් නිසි හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ඇ) ප්‍රමිතයෙහි ඡේද අංක 75 (ඊ) සහ (එ) ප්‍රකාරව ආයෝජන දේපලවලින් ලද ආදායම හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති 28 ක් සම්බන්ධයෙන් කෙරීගෙන යන වැඩ යටතේ දැක්වෙන එකතු වටිනාකම රු. 167,679,950 ක් වන ශේෂයන්, විමර්ශනය කොට මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු කිරීමකින් තොරව තොරව වර්ෂ තුනේ සිට නවයකට වඩා වැඩි කාල පරිච්ඡේදයක් නොවෙනස්ව පැවතුණි.

(ආ) රු.8,189,319,298 ක් වූ නිමකර ජනතා අයිතියට පත් කරන ලද ජල සම්පාදන ව්‍යාපෘති 40 ක පිරිවැය ප්‍රාග්ධනිත කිරීමෙන් තොරව 2017 දෙසැම්බර් 31 දිනට කෙරීගෙන යන වැඩතුළ පැවතුණි.

(ඇ) කැලණිය ප්‍රාදේශිකයේ පොත්වල දක්වා තිබූ රු.2,421,893 ක් වටිනා තොග ශේෂයක් වර්ෂ තුනකට අධික කාලයක් අපේක්ෂා කොට තිබූ අරමුණු සඳහා භාවිත කිරීමකින් තොරව පැවතුණි. තවද, මෙම තොගය භෞතිකව සත්‍යාපනය කර ගත නොහැකිව තිබුණි.

(ඈ) ත්‍රිකුණාමල ප්‍රාදේශිකයේ භෞතිකව සත්‍යාපනය කර තිබූ ප්‍රධාන අමතර කොටස් වටිනාකම රු.11,821,641 ක් වුවද රු.472,760 ක් වටිනා තොගයක් පමණක් ගිණුම් ගත කර තිබුණි.

(ඉ) යාපනය ප්‍රාදේශීය කාර්යාලයේ තොග සමීක්ෂණ වාර්තා අනුව ප්‍රාග්ධනිත කරන ලද වටිනාකම රු. 5,202,608 ක් වූ කල්බදු ගොඩනැගිලි, පිරිවැය රු.7,000,000 ක් වූ ජල කුළුණක් (යටිතල පහසුකම්) සහ රු. 11,853 ක් වූ අනෙකුත් වත්කම් හයක් භෞතිකව නොපැවතුණු බව නිරීක්ෂණය විය. කෙසේ වෙතත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ රු.780,532ක ක්ෂය වෙන්කිරීමක් සිදු කර තිබුණි. තවද, රු.3,000,000 ක පිරිවැයකින් යුතු භාවිතයට ගත නොහැකි මට්ටමේ පැවති වෙනත් ජල කුළුණක් ගිණුම්වලට ගෙන තිබූ අතර එය ඉවත්කිරීමට කිසිදු පියවරක් ගැනීමකින් තොරව රු.140,000 ක ක්ෂය වෙන්කිරීම් සිදු කර තිබුණි.

(ඊ) ප්‍රතිපත්තියක් ලෙස මණ්ඩලය විසින් අඛණ්ඩව සෑම වර්ෂයකම පෙර වර්ෂයේ ගැලපීම් වශයෙන් සමුච්චිත ලාභය / අලාභයට සැලකිය යුතු ගැලපීම් සිදු කරන බව විගණනයට නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් ඒ ඒ වර්ෂයේ ලාභය සැලකිය යුතු ලෙස විකෘති වී තිබුණි. 2013 සිට 2016 කාලපරිච්ඡේදය සඳහා එවැනි පෙර වර්ෂයට අදාළ ගැලපුම් හේතුවෙන් සමුච්චිත ලාභයට වූ බලපෑමෙහි එකතු වටිනාකම රු.මිලියන 631.70 ක් විය. මෙවැනි පසුබිමක් තුළ ඉදිරි වර්ෂය තුළ සමාලෝචිත වර්ෂයේ ලාභයට ගැලපීම් කිරීමේ හැකියාව විගණනයේදී බැහැර කළ නොහැක. ඒ හේතුවෙන් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයයෙහි විශ්වාසවන්ත බව සහ නිවැරදිභාවය පිළිබඳව සතුටුදායක ලෙස පිළිගත නොහැකිය. සමාලෝචිත වර්ෂය හා පෙර වර්ෂ දෙක තුළ සිදු කරන ලද එවැනි ගැලපීම් පිළිබඳ විස්තර පහත දැක් වේ.

| වර්ෂය | හරකළ වටිනාකම | බැරකල වටිනාකම | සමුච්චිත ලාභයට වූ ශුද්ධ බලපෑම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 2017 | 388,443,514 | 62,528,713 | 322,914,801 |
| 2016 | 454,847,390 | 336,150,543 | 118,696,847 |
| 2015 | 184,251,720 | 192,301,771 | 8,050,051 |
| 2014 | 88,633,609 | 269,544,864 | 180,911,255 |

(උ) සමාලෝචිත වර්ෂය තුළ වාහන දහයක් ඉවත්කර තිබුණද වත්කම් ඉවත්කිරීමේ ලාභය හෝ අලාභය ගණනය කිරීමේදී වාහන තුනක පමණක් පිරිවැය හා සමුච්චිත ක්ෂය වටිනාකම ගිණුම්ගත කොට තිබුණි. එම වත්කම් වලට අදාළව තොරතුරු නොමැති වීම හේතුවෙන් පිරිවැය හා සමුච්චිත ක්ෂය වටිනාකම සැලකිල්ලට නොගැනීම නිසා මූල්‍ය ප්‍රකාශවලට වූ බලපෑම විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී එකතු වටිනාකම රු. 77,011,565 ක් වූ ණයගැතියන් වෙනුවෙන් අපහායනය සඳහා වෙන්කිරීම් සිදු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(එ) සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.65,683,426 ක් වූ ආර්ථික සේවා ගාස්තු ලැබිය යුතු දෑ ලෙස හඳුනා නොගෙන වැරදි සහගත ලෙස සමාලෝචිත වර්ෂයේ ආදායම් බදු වියදම ලෙස හඳුනාගෙන තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය සහ 2017 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් ඒ හා සමාන අගයකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඒ) විගණනයේ ගණනය කිරීම් අනුව ස්ථාවර තැන්පතු දෙකක් සඳහා වූ ආයෝජන ආදායම රු.5,328,915 ක් විය. කෙසේවෙතත් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව එම ස්ථාවර තැන්පතුවලට අදාළව රු. 4,774,759 ක් පමණක් ආයෝජන ආදායම් ලෙස හඳුනාගෙන තිබුණි. ඒ හේතුවෙන් ස්ථාවර තැන්පත් ආයෝජනය මත වූ පොලී ආදායම රු. 554,156 ක් අඩුවෙන් දක්වා තිබුණි.

### 2.2.3 අවිනිශ්චිත ගිණුම

ශුද්ධ එකතු වටිනාකම රු. 793,285,170 ක් වූ මණ්ඩලයේ වත්කම්, වගකීම් හා ස්කන්ධ ශේෂයන් එවැනි ශේෂයන් විමර්ශනය කිරීමට පියවර ගැනීමකින් තොරව 2016 හා 2017 වර්ෂයන්වලදී අවිනිශ්චිත ගිණුමකට මාරුකර තිබූ අතර එම ශේෂයන් තුළ වටිනාකම රු. 18,600,450 ක් වූ දීර්ඝ කාලයක සිට හිඟව පවතින සේවකයන්ට ලබාදුන් ණය හා අත්තිකාරම් ද, වටිනාකම රු.37,129,982 ක් වූ කොන්ත්‍රාත්කරුවන්ට ලබා දුන් අත්තිකාරම්ද, වටිනාකම රු.13,071,361 ක් වූ තැන්පත් සහ වටිනාකම රු. 3,428,544 ක මුදල් පොත් ශේෂයක්ද ඇතුළත්ව තිබුණි. ඒ අනුව 2017 වර්ෂය අවසානයට අවිනිශ්චිත ගිණුමේ ශේෂය රු.116,455 ක් වූ අතර 2018 පෙබරවාරි මාසය අවසානය වන විටත් මෙම ගිණුම නිරවුල් කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 2.2.4 පැහැදිලි නොකරන ලද වෙනස්කම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් පොත් අනුව සමාලෝචිත වර්ෂය තුළ රු. 9,161,858 ක මුදලක් වත්කම් ඉවත් කිරීමෙන් ලැබී තිබුණි. කෙසේ වෙතත් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි ආයෝජන ක්‍රියාකාකරකම් වලින් ලද මුදල් ප්‍රවාහ යටතේ රු.2,001,798 ක වටිනාකමක් පමණක් දක්වා තිබුණි. රු.7,160,060 ක් වූ වෙනසට හේතුන් විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබූ ණයගැති ශේෂ හා මණ්ඩලයේ වාණිජ අංශය විසින් ඉදිරිපත් කරන ලද ණයගැති කාල විශ්ලේෂණ උපලේඛනයන් අතර රු.20,470,232 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) ප්‍රාදේශීය කාර්යාල විසින් ඉදිරිපත් කරන ලද ශේෂ පිරික්සුමෙහි දක්වා තිබූ විකුණුම් ආදායම් වටිනාකම සහ මණ්ඩලයේ වාණිජ අංශයේ දක්වා තිබූ සැසඳුම් කරන ලද ශේෂ අතර එකතුව රු.12,423,545 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) නිමවුම් පාදක සඳහා වන ගෝලීය හවුල් ව්‍යාපෘති විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 වන දිනට විදේශ ප්‍රදාන වටිනාකම රු.312,791,129 ක් විය. කෙසේ වෙතත් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.289,218,261 ක් ලෙස දක්වා තිබුණි. ඒ හේතුවෙන් එම වටිනාකම් දෙක අතර රු.23,572,868 ක පැහැදිලි නොකළ වෙනස්කමක් නිරීක්ෂණය විය.

(ඉ) අඹතලේ, පානදුර, කළුතර සහ ගම්පහ යන ප්‍රාදේශික හතරෙන් ලද ස්ථාවර වත්කම් ලේඛන වල දක්වා තිබූ දේපල, පිරියත හා උපකරණ වටිනාකම හා ඊට අනුරූපව විගණනය වෙත ඉදිරිපත් කරන ලද සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වා තිබූ එම වත්කම්හි අනුරූප වටිනාකම් සන්සන්දනය කිරීමේදී රු.45,327,376 ක හා රු.3,480,567 ක වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඊ) මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ ලෙජර් ගිණුම් හතරක යලි ප්‍රකාශිත ආරම්භක ශේෂ වටිනාකම සම්බන්ධයෙන් සහ විගණනය විසින් සිදු කරන ලද ගණනය කිරීම් අනුව රු. මිලියන 54.22 ක සමස්ත වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

| විස්තරය | මූල්‍ය ප්‍රකාශන අනුව යලි ප්‍රකාශිත ශේෂය | විගණනයේ ගණනය කිරීම් අනුව ශේෂය | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වෙනත් ණය ගැතියන් | 314,319,532 | 287,223,783 | 27,095,749 |
| කොන්ත්‍රාත්කරුවන් රඳවා ගැනීම් | 3,669,249,055 | 3,662,866,437 | 6,382,618 |
| ණය හිමි පාලන | 1,221,394,974 | 1,221,425,775 | 30,801 |
| දේශීය ණය | 19,767,069,288 | 19,746,356,156 | 20,713,132 |

(උ) වාණිජ අංශ වාර්තාවන්හි හා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ මනුගත විකුණුම් සහ තොග විකුණුම් වටිනාකම් අතර රු. මිලියන 76.8 ක සැසඳුම් නොකරන ලද වෙනසක් නිරීක්ෂණය විය.

(ඉ) සමාලෝචිත වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබූ පහත අයිතමයන් සහ විගණනයේ ගණනය කිරීම් අතර එකතුව රු. රු.130,712,618 ක වෙනසක් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

| අයිතමය | විගණනයේ ගණනය කිරීම් අනුව | මූල්‍ය ප්‍රකාශන අනුව | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| ණයගැතියන්, ලැබිය යුතු දෑ හා තැන්පතුවන්හි අඩුවීම | 17,370,079,818 | 17,491,801,822 | 121,722,004 |
| ස්ථාවර වත්කම් ඉවත් කිරීම් අලාභය | 2,664,753 | 4,495,307 | 1,830,554 |
| ඉවත්කළ වත්කම් සඳහා ලැබීම් | 2,001,798 | 9,161,858 | 7,160,060 |

(එ) මහ කොළඹ ජල හා අපජල කළමනාරණ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන - ව්‍යාපෘතිය 2 හි කොන්ත්‍රාත්කරුවන්ට ලබා දුන් අත්තිකාරම් වටිනාකමෙහි ලෙජර සහ විගණනයට ඉදිරිපත් කරන ලද උපලේඛන අතර රු. 13,856,197 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.2.5 හඳුනා නොගත් ශේෂ**

කළුතර ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ ලෙජරයෙහි එකතු වටිනාකම රු.655,561,757 ක හඳුනා නොගත් කෙරීගෙන යන වැඩ ශේෂයක් හඳුනාගෙන ප්‍රාග්ධනිත කිරීමකින් තොරව 2004 වර්ෂයේ සිට පැවතුණි.

**2.2.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත දක්වා ඇති ඒ ඒ අයිතමයන්ට එරෙහිව දක්වා ඇති සාක්ෂීන් විගණනයට ඉදිරිපත් නොවීය.

| | අයිතමය | වටිනාකම | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | කෙරීගෙන යන වැඩ | 92,429,112 | ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයන්හි විස්තරාත්මක උප ලේඛන |
| (ii) | චලනය නොවන සහ සෙමින් චලනය වන තොග | 1,006,678,141 | වයස් විශ්ලේෂණය |
| (iii) | වෙනත් ණය ගැතියන් | 294,984,707 | විස්තරාත්මක උපලේඛන |
| (iv) | වෙළඳ ණය හිමියන් | 833,652,596 | |
| (v) | වෙනත් ණය හිමියන් | 97,725,057 | |
| (vi) | ඉඩම් අත්පත් කර ගැනීමේ අත්තිකාරම් | 161,712,636 | |
| (vii) | සේවක විශේෂ ප්‍රසාද දීමනා අත්තිකාරම් | 9,608,060 | |

**2.2.7 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු. මිලියන 1,111 ක් වූ වෙළඳ ණයගැතියන්, මලාපවහන ණයගැතියන් හා වෙනත් ණය ගැති ශේෂයන් අයකර ගැනීමෙන් තොරව වර්ෂ දෙකකට වැඩි කාලයක් පැවතුණි.

(ආ) එකතුව රු.268,846 ක් වූ සැපයුම්කරුවන්ට දුන් අත්තිකාරම් වර්ෂයක කාලයක් ගතවී ඇතත් නිරවුල් කර නොතිබුණි.

(ඇ) ඉඩම් අත්පත් කරගෙන තිබුණද එම ඉඩම් අත්පත් කර ගැනීමට 2009 සිට 2014 දක්වා කාලපරිච්ඡේදය තුළ ලබා දෙන ලද රු.77,889,359 ක අත්තිකාරම් අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) ණය හිමි පාලන ගිණුමෙහි ඇතුළත් මුළු ණය හිමි ශේෂයන් සියයට විසිහයක ප්‍රතිශතයක් වන ණය හිමියන් වර්ෂයකට වැඩි කාලයක් නියෝජනය කරනු ලබයි.

(ඉ) වටිනාකම රු.39,877,391 ක් වූ වෙනත් ණයගැති ශේෂයන් වර්ෂ තුනකට වඩා වැඩි කාලයක සිට නිරවුල් නොකර පැවතුණි. මණ්ඩලය විසින් එම ණයගැතියන්ගේ දත්ත පද්ධතියක් පවත්වාගෙන ගොස් නොතිබූ නිසා තහවුරු ලිපි මගින් ඔවුන්ගේ ශේෂයන් විගණනයට සත්‍යාපණය කර ගත නොහැකි විය.

( උ) ගාල්ල ප්‍රදේශයේ අපජල අපහරණ ව්‍යාපෘතිය යටතේ අපජලය පිරිපහදු කිරීමේ පිරියත ඉදිකිරීම වෙනුවෙන් ඉඩමක් මිලදී ගෙන තිබුණි. මිනුම් දෙපාර්තමේන්තුව විසින් මෙම ඉඩම රු. මිලියන 71.5 කට ආගණනය කොට තිබුණු අතර වටිනාකමින් සියයට 30 කට සමාන වන රු. මිලියන 21.25 ක් අත්තිකාරම් ලෙස 2014 අප්‍රේල් මාසයේදී ඉඩමේ අයිතිකරු වෙත ඉඩමේ අයිතිය ලබා ගැනීමකින් තොරව ගෙවා තිබුණි. මෙම ඉඩමෙහි දැනටමත් පවුල් කිහිපයක් විසින් පදිංචිව සිටින අතර අත්තිකාරම් ලබා ගැනීමෙන් පසුවද අයිතිකරු විසින් ඉඩමෙන් පස් ඉවත් කර ගෙන තිබුණි. එලෙස ගෙවූ අත්තිකාරම් හා ඒ මත වූ දඩ මුදල 2018 ජුනි 30 වන විටත් අය කරගෙන නොතිබුණි.

(ඌ) රු.6,020,554 ක් වටිනාකම වූ කෑගල්ල ප්‍රාදේශිකයේ නිරවුල් නොකළ ණය හිමි පාලන ගිණුම් ශේෂය 2017 දෙසැම්බර් 31 දිනට වර්ෂ දෙකක් තිස්සේ පැවතුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 770. | වටිනාකම රු.13,082,076 ක් වූ යල්පැනගිය තොගය 2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කොට තිබුණි. |
| ආ) | 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරණ කළමණාකරන සේවා චක්‍රලේඛය | මණ්ඩලයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය සඳහා කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| ඇ) | 2017 අංක 07 දරන ආර්ථික සේවා ගාස්තු (ආ.සේ.ගා.) (සංශෝධිත) පනත | සමාලෝචිත වර්ෂය තුළ ගෙවූ ආර්ථික සේවා ගාස්තුව ඉදිරියට ගෙන යාමෙන් තොරව වර්ෂයේ ලාභයට අයකර ගෙන තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතු පසුගිය වර්ෂය හා සසඳන විට රු.2,991,969,398 (යලි ප්‍රකාශිත) බදු පූර්ව ශුද්ධ ලාභයට අනුරූපිව රු.1,882,455,821 ක බදු පූර්ව ශුද්ධ ලාභයක් ලැබීමට හේතු වී තිබූ අතර, එයින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. 1,109,513,577 ක පිරිහීමක් දැක්විය. විකුණුම් පිරිවැය, පරිපාලන වියදම හා මූල්‍ය වියදමෙහි වූ ප්‍රමාණාත්මක ඉහළ යාම මෙම මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

කෙසේ වෙතත් එකතු වටිනාකම රු. මිලියන 17,972 ක් සේවක වේතන පිරිවැය, බදු වියදම හා ක්ෂය ගිණුම්ගත කිරීමෙන් අනතුරුව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් මණ්ඩලයේ එකතු කළ අගය රු. මිලියන 19,789 ක් වූ අතර ඉකුත් වර්ෂයේදී එය රු. මිලියන 18,808 ක් විය. එබැවින් ඉකුත් වර්ෂය සමඟ සන්සන්දනය කිරීමේදී මණ්ඩලයේ එකතු කළ අගය රු. මිලියන 981 කින් හෙවත් සියයට 5.2 කින් ඉහළ ගොස් තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

### 3.2.1 ලාභදායීත්වය

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දළ ලාභය සියයට 4.3 කින් පහල ගියද ඉකුත් වර්ෂයට සාපේක්ෂව පරිපාලන වියදම් සියයට 8.74 කින් ඉහල ගොස් තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල වාර්තා කර තිබූ රු. 738,091,347 ක් වූ මෙහෙයුම් ලාභය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 58.04 කින් පහල ගොස් තිබුණි.

(ආ) 2016 වර්ෂයේදී වාර්තා වූ රු. 975,560 ක හා 289,023 ක ඒක පුද්ගල දායකය හා ශුද්ධ ලාභය 2017 වර්ෂයේදී පිළිවෙලින් සියයට 4 කින් හා 37 කින් හෙවත් රු.936,538 ක් හා රු.182,084 ක් දක්වා පහල ගොස් තිබුණි.

(ඇ) 2016 වර්ෂයේදී පාරිභෝජනය කරන ලද ජල ඒකකයකින් වූ රු. 43.93 ක ආදායම 2017 වර්ෂයේදී සියයට 3 කින් අඩු වී තිබුණු අතර 2016 වර්ෂයේදී රු. 46.53 ක් වූ පරිභෝජනය කරන ලද ජල ඒකකයක නිෂ්පාදන පිරිවැය 2017 වර්ෂයේදී සියයට 1.2 කින් ඉහල ගොස් තිබුණි.

### 3.2.2 වැදගත් ගිණුම්කරණ අනුපාත

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතර සඳහා වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| වර්ෂය | 2017 | 2016 | 2015 | 2014 | 2013 |
|---|---|---|---|---|---|
| දළ ලාභ ආන්තිකය | 40.50 | 42.82 | 39.19 | 39.47 | 41.35 |
| ශුද්ධ ලාභ ආන්තිකය | 7.61 | 12.68 | 5.53 | 7.62 | 5.87 |
| ජංගම අනුපාතය | 4.14 | 5.97 | 4.48 | 1.76 | 1.29 |
| ක්ෂණික අනුපාතය | 3.72 | 5.33 | 3.80 | 1.35 | 0.98 |
| මුළු වත්කම් පිරිවැටුම (වාර ගණන) | 0.05 | 0.06 | 0.06 | 0.07 | 0.07 |

ඉහත තොරතුරු අනුව ඉකුත් වර්ෂ හතර සමඟ සැසඳීමේදී මණ්ඩලයේ ප්‍රධාන මූල්‍ය අනුපාතයන්හි අයහපත් තත්ත්වයක් පෙන්නුම් කර තිබුණි. ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සමාලෝචිත වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභ ආන්තිකය විශාල ලෙස සියයට 5.07 කින් පහල ගොස් තිබූ අතර ඉදිරි මූල්‍ය වර්ෂ තුළදී ගෙවිය යුතු විදේශ ණය ඉහළ යාම හේතුවෙන් ජංගම හා ක්ෂණික අනුපාතය පිළිවෙලින් සියයට 1.83 කින් හා සියයට 1.61 කින් පහල ගොස් තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය
-----------------------------

### 4.1 කාර්ය සාධනය
------------------

#### 4.1.1 සැලසුම්කරණය හා සමාලෝචනය
---------------------------------------

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) 2016 – 2020 කාලපරිච්ඡේදය සඳහා වූ සංයුක්ත සැලසුම පිළියෙල කිරීමට පෙර ව්‍යාපාරය තුළ පවතින දුර්වලතා සහ බාහිර පරිසරය තුළ ඇති අවස්ථා හා තර්ජන පිළිබඳව විධිමත් ලෙස ඇගයීමකට ලක් කර නොතිබුණි.

(ආ) 2014 පෙබරවාරි 17 දිනැති හා අංක 01/2014 දරණ රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තු, වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම, මානව සම්පත් සංවර්ධන සැලස්ම, ණය ආපසු ගෙවීමේ සැලස්ම හා අභ්‍යන්තර විගණන සැලස්ම ක්‍රියාකාරී සැලැස්ම තුළ ඇතුළත් කොට නොතිබුණි.

(ඇ) ක්‍රියාකාරී සැලැස්මට අනුව 2017 වර්ෂය තුළදී ආරම්භ කිරීමට නියමිතව තිබූ මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘති හතක් හා මහා පරිමාණ අපවහන ව්‍යාපෘති තුනක් 2018 ජූලි 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඈ) ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය අවසානය වන විට සිටින මුළු ජනගහනයෙන් ජල නල සැපයුම් ආවරණය හා අපවහන ආවරණය පිළිවෙලින් සියයට 52.3 ක් හා සියයට 2.4 ක් දක්වා ඉහළ නැංවීමට අපේක්ෂා කොට තිබුණි. කෙසේ වෙතත් 2017 වර්ෂයේ අවසානයට වූ සත්‍ය ආවරණය පිළිවෙලින් සියයට 49.2 ක් හා සියයට 2.07 ක් විය.

#### 4.1.2 පිරිසිදු ජලය නිෂ්පාදනය හා බෙදාහැරීම
---------------------------------------------

පිරිපහදු ජල නිෂ්පාදනය සහ එහි පිරිවැය සහ පසුගිය වසර කිහිපය සඳහා ලබා දුන් නව සම්බන්ධතා ප්‍රමාණය සම්බන්ධයෙන් වූ තොරතුරු පහත පරිදි වේ.

| වර්ෂය | 2017 | 2016 | 2015 | 2014 |
|---|---|---|---|---|
| නිෂ්පාදනය (ඝන මීටර) මිලියන | 678 | 649 | 600 | 575 |
| ඒකක පිරිවැය (රු.) | 35.49 | 34.61 | 34.41 | 31.79 |
| නව සම්බන්ධතා ගණන | 2,219,172 | 2,092,471 | 1,947,473 | 1,825,837 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේදී මණ්ඩලය විසින් නිෂ්පාදනය කරන ඝන මීටර මිලියන 649 ට සාපේක්ෂව 2017 වර්ෂයේදී පිරිපහදු ජලය ඝන මීටර මිලියන 678 ක් නිෂ්පාදනය කර තිබූ අතර එහි සියයට 4.5 ක වැඩිවීමක් දැක්වුණි. ඒ හා සමානව 2016 වර්ෂය සමඟ සන්සන්දනය කිරීමේදී සමාලෝචිත වර්ෂයේදී ඒකක නිෂ්පාදන පිරිවැය සියයට 2.5 කින් ඉහළ ගොස් තිබුණි. 2012 සිට 2017 කාලපරිච්ඡේදය තුළ කාර්ය මණ්ඩල පිරිවැය, බලශක්ති පිරිවැය, රසායන ද්‍රව්‍ය පිරිවැය හා නඩත්තු පිරිවැයෙහි වූ ප්‍රමාණාත්මක වර්ධනය මෙම වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

(ආ) සමාලෝචිත වර්ෂය සඳහා සකස් කර තිබූ ඉක්කය අනුව, සමාලෝචිත වර්ෂය තුල නව සම්බන්ධතා 231,198 සපයමින් (2014 සිට 2017 දක්වා වූ සමුච්ඡිත හිඟ සම්බන්ධතා ඇතුළුව) වර්ෂය අවසානය වන විට සම්බන්ධතා 2,323,669 ක් ලබාදීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළදී නව සම්බන්ධතා 126,701 ක් පමණක් සපයා තිබූ අතර පසුගිය වර්ෂය සමඟ සැසඳීමේදී එහි සියයට 8.71 ක අඩුවීමක් දක්වුණි.

### 4.1.3 ආදායම් නොලබන ජලය (NRW)

සමාලෝචිත වර්ෂය හා පසුගිය වසර පහත ආදායම් නොලබන ජලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විස්තරය | 2017 | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|---|
| ජලය නිෂ්පාදනය (ඝන මීටර්) | 678.9 | 649 | 600.14 | 575.00 | 547.0 | 525.6 |
| ජලය පරිභෝජනය (ඝන මීටර්) | 507.5 | 483 | 436.27 | 410.92 | 381.6 | 368.5 |
| ආදායම් නොලබන ජලය (ඝන මීටර්) | 171.3 | 166 | 163.87 | 137.07 | 165.4 | 157.1 |
| **ආදායම් නොලබන ජලය ජලය නිෂ්පාදනයේ ප්‍රතිශතයක් ලෙස** | **25.23** | **25.58** | **27.30** | **28.53** | **30.24** | **29.89** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් ද කරනු ලැබේ.

(i) ආදායම් නොලබන ජල වටිනාකම වෙනම ගිණුම් ගත කිරීමකින් තොරව සාමාන්‍ය පිරිවැයක් ලෙස ගිණුම්වලට ගෙන තිබුණි. තවද 2012 සිට 2014 කාල පරිච්ඡේදය තුළ ආදායම් නොලබන ජලය මුළු ජල නිෂ්පාදනයෙන් ආසන්න ලෙස 1/3 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ එය 1/4 ක් දක්වා අඩු කර ගෙන තිබුණි. කෙසේ වෙතත්, කාන්දු වීම්, නිත්‍යානුකූල නොවන ජල සම්බන්ධතා, නොමිලයේ සැපයීම හා පරිපාලන දුර්වලතා ආදිය හේතුවෙන් මේ වන තුරු ආදායම් නොලබන ජලය මණ්ඩලයට ප්‍රමාණාත්මක අලාභ ඇති කරනු ලැබේ. 2017 දී කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය කොටස සියයට 43.14 ක් වූ අතර කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය අවම කිරීම සඳහා කැපී පෙනෙන උත්සාහයක් ගෙන නොතිබුණි.

(ii) වර්ෂ 75 කට වඩා පැරණි වූ කොළඹ නගරයේ ප්‍රධාන ජලය බෙදාහැරීම් පද්ධති නවීකරණය කිරීම සඳහා අවශ්‍යතාවයන් තිබීම හේතුවෙන් එම කාර්යය සඳහා සැලසුම් පිළියෙල කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කඩිනම් අවශ්‍යතාවය කෙරෙහි මණ්ඩලයේ විශේෂ අවධානය යොමු කර තිබුණි. දැනට මේ සම්බන්ධයෙන් පිරිවැය රු. මිලියන 30,124 ක් වූ විදේශ මූල්‍යායන ව්‍යාපෘති දෙකක් ක්‍රියාත්මක කරමින් පැවතියද, ප්‍රධාන ජල සැපයීම් නල පිළිබඳ ප්‍රතිසංස්කරණය එයින් ප්‍රමාණවත්ව ඉටුකර ගෙන නොතිබුණි.

(iii) කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය සියයට 49 සිට සියයට 20 දක්වා අවම කර ගැනීම ප්‍රධාන වශයෙන් අවධානයට යොමු කරගත් මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන - ව්‍යාපෘතිය (01) 2016 දෙසැම්බර් 31 දින අවසන් කිරීමට සැලසුම් කොට තිබුණි. කෙසේ වෙතත් එය 2018 සැප්තැම්බර් 30 වන විටත් අවසන් කොට නොතිබුණි. තවද 2018 ජූලි 31 දිනට භෞතික ප්‍රගතිය සියයට 46.18 ක් පමණක් විය.

(iv) මහ කොළඹ ජල සහ අප ජල කළමනාකරණ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන - ව්‍යාපෘතිය (02) 2014 සැප්තැම්බර් 03 දින ආරම්භ කොට 2019 ජුනි 30 දින අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වෙතත් 2016 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රධාන කොන්ත්‍රාත් කාර්යයන් ආරම්භ කර නොතිබූ අතර 2017 දෙසැම්බර් 31 දිනට සියයට 5.61 ක භෞතික ප්‍රගතියක් පමණක් ලගා කර ගෙන තිබුණි.

(v) ජල කාන්දු වීම් අවම කර ගැනීම සඳහා ප්‍රතිස්ථාපනය කළ යුතුව ඇති ප්‍රධාන ජලය බෙදා හැරීමේ පද්ධති මෙදින දක්වා විශේෂිතව හඳුනාගෙන නොතිබුණි. ප්‍රධාන ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජනා කිහිපයක් කර තිබුණද ඒවායේ ක්‍රියාත්මක වීම ඉතා මන්දගාමී තත්වයක් විය.

(vi) කොළඹ නගරය හැර අනිකුත් ප්‍රදේශවල විශේෂයෙන් නැගෙනහිර කොළඹ නගරය, ගම්පහ, රත්නපුර, හම්බන්තොට සහ බණ්ඩාරවෙල හි ආදායම් නොලබන ජලය අඩු කිරීම කෙරෙහි මණ්ඩලයේ අවධානය ප්‍රමාණවත් නොවූ අතර ඒ හේතුවෙන් සංයුක්ත සැලැස්මේ දක්වා ඇති ඉලක්කයන් තාත්වික නොවන බව නිරීක්ෂණය විය.

(vii) ආදායම් නොලබන ජලය සියයට 1 කින් අඩු කර ගැනීමට මණ්ඩලයට හැකියාව පවතී නම් මුළු නිෂ්පාදන පිරිවැය රු. මිලියන 240.46 කින් අඩු කර ගැනීමට හැකි බව තවදුරටත් නිරීක්ෂණය විය.

(viii) ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයන්හි (ප්‍රා.සේ.ම.) සත්‍ය සහ ඉලක්කගත ආදායම් නොලබන ජල ප්‍රතිශතයන් අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

| | **ආදායම් නොලබන ජලය 2017 (ප්‍රතිශතයක් ලෙස)** | | |
|---|---|---|---|
| **ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ නම** | **ඉලක්කය** | **සත්‍ය** | **විචලතාවය [හිතකර (අහිතකර)]** |
| බස්නාහිර - මධ්‍යම | 34.5 | 33.8 | 0.7 |
| බස්නාහිර - දකුණ | 26.4 | 20.6 | 5.8 |
| බස්නාහිර - උතුර | 23.0 | 19.3 | 3.7 |
| දකුණ | 26.0 | 22.7 | 3.3 |
| ඌව | 20.3 | 25.9 | 5.6 |
| මධ්‍යම | 22.0 | 22.6 | (0.6) |
| සබරගමුව | 23.8 | 30.3 | (6.5) |
| උතුර - බටහිර | 10.0 | 13.0 | (3.0) |
| නැගෙනහිර | 13.3 | 22.8 | (9.5) |
| උතුරු මැද | 15.2 | 16.9 | (1.7) |
| උතුර | 21.0 | 26.6 | (5.6) |
| සමස්ත | 27.3 | 25.2 | (2.1) |

### 4.1.4 මලාපවහන පද්ධතිය

රටේ ආර්ථික සංවර්ධනයත් සමඟ ඇතිවූ නාගරිකරණය හේතුවෙන් නගරවල මලාපවහන අපහරණය සඳහා යටිතල පහසුකම් වෙනුවෙන් වැඩිදියුණු කිරීම් සිදුකිරීමේ අවශ්‍යතාවය පැන නැගුණි. එම පහසුකම් සැපයීම මණ්ඩලයේ වගකීමක් වුවද, මෑත වර්ෂවලදී මෙම ක්ෂේත්‍රය පිළිබඳ ප්‍රමාණවත් ප්‍රගතියක් දක්වා නොතිබුණි.

### 4.2 විදේශ මූල්‍යායන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

සමාලෝචිත හා ඉකුත් වර්ෂයන්හිදී දේශීය හා විදේශීය මූල්‍යායන් භාවිතා කරමින් ජල සම්පාදන හා සනීපාරක්ෂක (අපවහන) ව්‍යාපෘතීන් විශාල ප්‍රමාණයක් ක්‍රියාත්මක කරනු ලැබීය. එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් වූ නිරීක්ෂණයන් පහත ඡේදයන්හි විස්තර කොට ඇත.

### 4.2.1 අඹතලේ බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය

පහත සඳහන් නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) මෙම ව්‍යාපෘතියේ මුළු ක්‍රියාත්මක කිරීම් කාල පරිච්ඡේදය මාස 63 ක් වූ අතර 2017 දෙසැම්බර් 31 දින වන විට මාස 39 ක් ගෙවී ගොස් තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යය සාධනය හේතුවෙන් එදිනට වූ සමස්ත භෞතික ප්‍රගතිය සියයට 7.7 ක් පමණක් විය.

(ii) කිලෝමීටර 9ක් සඳහා පැරණි නල වෙනුවට මිලිමීටර 1200 විශ්කම්භයෙන් හා ධාරිතාවයකින් යුතු නව නල යෙදීම සඳහා වූ ප්‍රධාන කොන්ත්‍රාත්තුව 2018 මැයි 04 වන දින අවසන් කිරීමට සැලසුම් කොට තිබුණි. කෙසේ වෙතත් 2018 මැයි 04 වන දිනට මීටර 500ක පමණක් නල එලීම සිදු කොට තිබුණි.

### 4.2.2 මහ කොළඹ ජල හා අපජල කළමනාකරණ ආයෝජන වැඩසටහන - ව්‍යාපෘතිය 01

පහත නිරීක්ෂණ සිදු කරනු ලැබේ.

(i) වැඩසටහනෙහි ප්‍රගති වාර්තා අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 37.41 සහ සියයට 47.39 ක්ව පැවතුණි. කොළඹ නගරයේ උතුරු සහ නැගෙනහිර ප්‍රදේශයන්හි ආදායම් නොලබන ජලය අවම කිරීම සඳහා පද්ධති පුනරුත්ථාපන ප්‍රධාන කොන්ත්‍රාත්තුව යටතේ වූ කෙරීගෙන යන වැඩවල 2017 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් සියයට 45ක සහ සියයට 27 ක මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි. ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුගත වීමේ ප්‍රමාදයන්, නල එලීමේ වැඩ සඳහා කාණු රහිත ක්‍රමයේ සිට විවෘත කාණු ක්‍රමය දක්වා වෙනස් කිරීම සහ කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය යනාදිය වැඩසටහනෙහි ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේ මන්දගාමී ප්‍රගතිය සඳහා ඉවහල් වී තිබුණි.

(ii) කොළඹ නගරයේ උතුරු කොටසෙහි ආදායම් නොලබන ජලය අවම කිරීම සඳහා වූ පද්ධති පුනරුත්ථාපනය ලංසු ලේඛන අනුව නල එලීම සඳහා කාණු රහිත ක්‍රමය වෙනුවට විවෘත කාණු ක්‍රමය මගින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට තිබුණි. කෙසේ වෙතත් මෙම කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමෙන් පසුව කොන්ත්‍රාත්කරු විසින් කාණු රහිත ක්‍රමය වෙනස් කිරීමට යෝජනා ඉදිරිපත් කර තිබූ අතර ලංසු ලේඛනයවන්හි 3.1 සහ 13.2 ඡේදයන් ප්‍රකාරව අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් තොරව විචලතා කමිටුව විසින් අනුමැතිය ලබා දී තිබුණි. ජල සම්පාදන ජාලයෙහි වර්තමාන තත්වය සහ වැඩබිම්හි පවතින සත්‍ය තත්වය සැලකිල්ලට ගෙන විධිමත්ව සැලසුම් කර නොතිබූ බව නිරීක්ෂණය විය. කොන්ත්‍රාත්තුවේ මූලික විෂය පථය වෙනස් කිරීම හේතුවෙන් කාණු රහිත තාක්ෂණය යටතේ ලංසු ඉදිරිපත් නොකළ කොන්ත්‍රාත්කරුවන් සඳහා අවස්ථාව සලසා දී තිබුණි.

**4.2.3 මහකොළඹ ජල සහ අපජල කළමනාකරණ ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන -ව්‍යාපෘතිය 2**

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) මෙම ව්‍යාපෘතිය සංරචක 13 කින් සමන්විත වූ අතර කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීමේ ප්‍රමාදය, කොන්ත්‍රාත්කරුවන්ගේ දුර්වල කාර්ය සාධනය, කොළඹ මහ නගර සභාවෙන් අනුමැතිය ලබා ගැනීමේ ප්‍රමාදය සහ දුර්වල ව්‍යාපෘති කළමනාකරණය යනාදිය හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘති සංරචකයන්හි සමස්ත භෞතික ප්‍රගතිය සියයට 5.61 ක් විය. තවද පාමංකඩ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම, රජය සතු මහල් නිවාසයන්හි ජල නල පද්ධති පුනරුත්ථාපනය සහ බටහිර මධ්‍යම ප්‍රාදේශීය සභය සේවා මධ්‍යස්ථානය සඳහා මෙහෙයුම් උපකරණ තොග 2ක් ප්‍රසම්පාදනය යන කොන්ත්‍රාත්තුවන් 2017 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රදානය කර නොතිබුණි.

(ii) තවද ව්‍යාපෘතිය විසින් ප්‍රදානය කරන ලද කොළඹ නගරයේ බටහිර සහ දකුණ යන ප්‍රදේශ සඳහා ආදායම් නොලන ජල සඳහා වූ පද්ධති පුනරුත්ථාපන සංරචකය යටතේ සහ ජංගම ප්‍රජා දැනුවත් කිරීම් සහ චර්යා වෙනස් කිරීම සඳහා වූ උපදේශන සේවා කොන්ත්‍රාත්තුවන්හි අවසන් කිරීමේ දිනයන් ව්‍යාපෘති අවසන් කිරීමේ දිනය වූ 2019 ජුනි 30 දිනෙන් ඔබ්බට නියම කර තිබුණි.

(iii) ණය නියෝජ්‍යායතනය විසින් හදිසි ප්‍රසම්පාදනයන් ලෙස අනුමත කොට තිබුණද, කොළඹ නගරයේ ආදායම් නොලබන ජලය අවම කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කිරීම සඳහා දින 504 ක් ගත කොට තිබූ බව තව දුරටත් නිරීක්ෂණය විය. තවද, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් මූලික අදියරයන්හි දී විධිමත් කල් පවත්නා සමීක්ෂණයන් මත පදනම්ව තාත්වික ඇස්තමේන්තු පිළියෙල කොට නොතිබූ අතර ඒ හේතුවෙන් මෙම සංරචකය යටතේ ඇස්තමේන්තුගත කිලෝමීටර 99 ක් වූ නල එලීම් කාර්යයන්හි දිග කිලෝමීටර 194.5 ක් දක්වා සැලකිය යුතු ලෙස ඉහළ ගොස් තිබුණි.

(iv) කොන්ත්‍රාත්තුවේ ලංසු ලේඛන අනුව තෝරාගත් ලංසුකරු විසින් අමුද්‍රව්‍ය භාවිතය මත වූ නිෂ්පාදන අනුකූලතා සහතිකය සහ ඇගයීම ක්‍රියාවලිය සඳහා සම්බන්ධ වන ප්‍රධාන නිලධාරීන් පිළිබඳ විස්තර ලංසු ඉදිරිපත් කිරීමේ අවසාන දිනට ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත් කොළඹ නගරයේ බටහිර ප්‍රදේශයේ ආදායම් නොලබන ජලය අවම කිරීම සඳහා වූ පද්ධති පුනරුත්ථාපන සංරචකය යටතේ වූ කොන්ත්‍රාත්තුව කොන්ත්‍රාත් ගිවිසුම අත්සන් කළ දිනය වූ 2016 දෙසැම්බර් 01 වන දින වන විටත් නියමිත සහතික ඉදිරිපත් නොකළ ලංසුකරුවකු වෙත ප්‍රදානය කොට තිබුණි. තවද 2017 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුව යටතේ වූ ක්‍රියාකාරකම්හි සියයට 9.57 ක මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි. ඊට අමතරව ඉහතකී කොන්ත්‍රාත්තුව යටතේ දිස්ත්‍රික් මනු කියවීම් ප්‍රදේශ 18 ක සහ ප්‍රධාන බෙදාහැරීම් පද්ධති 2 ක ජල පීඩනය පදනම් කරගෙන නල මාර්ග සැලසුම් කිරීම 2018 මාර්තු 30 වන විටත් අවසන් කර නොතිබුණි.

(v) 2017 ජනවාරි 10 වන දිනට ප්‍රදානය කොට තිබූ කොළඹ නගරයේ දකුණු ප්‍රදේශයේ ආදායම් නොලබන ජලය සඳහා වූ පද්ධති පුනරුත්තාපන කොන්ත්‍රාත්තුව යටතේ දිස්ත්‍රික් මනු කියවීම් ප්‍රදේශ 9 ක ජල පීඩනය පදනම් කරගෙන නල මාර්ග සැලසුම් කිරීම 2018 මාර්තු 30 වන විටත් සම්පූර්ණ කොට නොතිබුණි. තවද සමීක්ෂණය කළ යුතුව තිබූ නිවාස 35,000 ක ඉලක්කයෙන් විෂය ගත නිවාස 15,894 ක් 2017 දෙසැම්බර් 31 දිනට සමීක්ෂණය කොට තිබුණි. ඒ හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට පෙර නිමකිරීමට අපේක්ෂා කොට තිබූ කිලෝමීටර 155 ක වැඩවලින්, කිලෝමීටර 02ක පමණක් නල එලීම් වැඩ අවසන් කොට තිබුණි.

(vi) ජල පරිභෝගිකයන් සඳහා වූ මහජන දැනුවත් කිරීම් වැඩසටහන් වෙනුවෙන් පිළියෙල කරන ලද ප්‍රගති වාර්තාවන් සමාලෝචිත වර්ෂය තුළ පවත්වන ලද එම වැඩසටහන් සංඛ්‍යාවෙන් පමණක් සමන්විතව තිබූ බව නිරීක්ෂණය විය. එකිනෙක පැකේජයන් යටතේ 2017 දෙසැම්බර් 31 දිනට පවත්වන ලද එම වැඩසටහන්හි විස්තර, හඳුනාගත් ගැටළු සඳහා වූ නිර්දේශ සහ විසඳුම් යනාදිය ඒ තුළ අන්තර්ගතව නොතිබුණි. ඒ නිසාවෙන් දැනුවත් කිරීම් වැඩසටහන්වලට සහභාගී වීමෙන් පසු පරිභෝජන රටාවෙහි වූ වෙනස්කම් ඇගයීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් නොතිබුණි.

(vii) පාමංකඩ ප්‍රාදේශීය ඉංජිනේරු කාර්යාලයේ භාවිතය සඳහා නාගරික සංවර්ධන අධිකාරියට අයත් 2015 සැප්තැම්බර් 02 වන දින කල්බදු පදනම මත ව්‍යාපෘතිය විසින් අත්පත් කරගත් ඉඩම, ඒ සඳහා ගෙවන ලද රු. මිලියන 10 ක අත්තිකාරම් මුදල අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව 2017 අගෝස්තු කාලපරිච්ඡේදය තුළ කොළඹ මහ නගර සභාව වෙත පවරා තිබුණි. ඊට අමතරව කාර්යාල ගොඩනැගිල්ලේ ගෘහ නිර්මාණ සැලසුම් සඳහා සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු. මිලියන 2.11 ක අනෙක් අත්තිකාරම ඊට අයත් ඉඩම පවරා තිබීම හේතුවෙන් ඵලදායී නොවී තිබුණි.

(viii) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2016 මාර්තු 24 දින නිකුත් කරන ලද අංක 01/2016 චක්‍රලේඛයේ ඡේද අංක 2.3.2 හි සඳහන් අවශ්‍යතාවයන්ට පටහැනි ලෙස ව්‍යාපෘතියේ ක්‍රියාත්මක නියෝජ්‍ය ආයතනය විසින් ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ වැඩබැලීමේ පදනම මත නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නැගෙනහිර පළාත්) තනතුරට පත් කර තිබුණි.

### 4.2.4 නිමවුම් පාදක ආධාර මත වන ගෝලීය හවුල් ව්‍යාපෘතිය

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ඇමෙරිකානු ඩොලර් මිලියන 5.08 කට සමාන රු. මිලියන 583.66 කට එකඟව තිබූ මුළු ප්‍රදාන වටිනාකමින් ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භ කොට වසර 6ක් ගතවී 2017 දෙසැම්බර් 31 දිනට ඇමෙරිකානු ඩොලර් මිලියන 2.31 ට සමාන වන ශ්‍රී ලංකා රු. මිලියන 340.76 ක් හෙවත් සියයට 45.47 ක් පමණක් උපයෝජනය කොට තිබුණි. එම නිසා කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්යසාධනය මත ව්‍යාපෘතියේ ඉතිරි කාල පරිච්ඡේදය තුළ වෙන්කිරීම්වලින් ඉතිරිය උපයෝජනය කිරීමේ හැකියාව පිළිබඳ නිශ්චිත නොවේ.

(ii) ව්‍යාපෘති ලේඛනය අනුව ව්‍යාපෘතිය සංරචක 7 කින් සමන්විතව තිබූ අතර කොන්ත්‍රාත් ප්‍රදානයේදී සිදුවූ ප්‍රමාදය සහ කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය මත ඒ අතරින් ස්ථානීය සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීම සංරචකයෙහි 2017 දෙසැම්බර් 31 දිනට සියයට 26.52 ක මන්දගාමී ප්‍රගතියක් දක්වා තිබුණි. තවද 2017 දෙසැම්බර් 31 දිනට සියයට 100 ක භෞතික ප්‍රගතියක් අපේක්ෂා කර තිබුණද ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවන් අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘති සංරචකයන්හි සමස්ත භෞතික ප්‍රගතිය සියයට 91.6 ක්ව පැවතුණි.

(iii) ස්ථානීය සනීපාරක්ෂාව වැඩිදියුණු කිරීම සංරචකයෙහි කොන්ත්‍රාත්තුව 2016 මැයි 16 වන දින ප්‍රදානය කොට තිබූ අතර පිරිපහදු ඒකක 3,785 ක් සැපයුම් කිරීම සහ සවිකිරීමටත් 2017 අගෝස්තු 31 වන විට දෙහිවල, මොරටුව, කොලොන්නාව සහ ජා-ඇල ප්‍රදේශයන්හි වැසිකිළි 1,135 ක් ඉදිකිරීමටත් සැලසුම් කොට තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත් ප්‍රදානයේ ප්‍රමාදය, කොල්ලුපිටියේ ස්ථාපිත කොට ඇති නිෂ්පාදන වැඩබිමෙහි ප්‍රමාණවත් පරිදි ශ්‍රම බලකා හිඟය සහ පිරිපහදු ඒකකයන්හි හස්ත පරිසැකසුම් කාර්යයන්හි දුර්වල කාර්යසාධනය යනාදී හේතුවෙන් 2017 දෙසැම්බර් 31 වන විට සැලසුම් කර තිබූවන්ගෙන් පිළිවෙළින් පිරිපහදු

ඒකක සවිකිරීම් 556 ක් පමණක් හෙවත් සියයට 15 ක් ද වැසිකිළි 205 ක් හෙවත් සියයට 18 ක් පමණක්ද නිමකොට තිබුණි. ඉන් අනතුරුව කොන්ත්‍රාත් කාර්යයන් කඩිනම් කිරීම සඳහා එම කොන්ත්‍රාත්තුව වෙනත් කොන්ත්‍රාත්කරුවන් 4 දෙනෙකුට ප්‍රදානය කිරීමට 2018 මැයි 15 වන දින තීරණය කොට තිබුණි. කෙසේ වෙතත් සවිකිරීම්වලින් කොටසක් අත්පත් කර ගැනීමෙන් පසුවද 2018 ජූලි 17 වන විටත් නව කොන්ත්‍රාත්කරුවන්ගේ පිරිපහදු ඒකකවල දෛනික අවශ්‍යතාවය සැපයුම් කිරීමට ප්‍රධාන කොන්ත්‍රාත්කරු අපොහොසත්ව තිබුණි.

(iv) කොලොන්නාව දිස්ත්‍රික් ලේකම් බල ප්‍රදේශය තුළ ස්ථානීය සනීපාරක්ෂක පහසුකම් 950 ක් සැපයීමටත්, වැසිකිළි 285 ක් ඉදිකිරීමටත් ව්‍යාපෘතිය සැලසුම් කොට තිබුණි. ඒ අනුව 2017 දෙසැම්බර් 31 දිනට ඇප සුරැකුම්, රක්ෂණය, ලිබඩු නඩත්තු කිරීම් යනාදිය වෙනුවෙන් රු.2,135,939 ක මුදලක් ව්‍යාපෘතිය වැය කොට තිබුණි. කෙසේ වෙතත් ප්‍රතිලාභීන් වෙත කිසිදු ප්‍රතිලාභයක් ලබාදීමට ව්‍යාපෘතිය අපොහොසත්ව තිබූ බව අනාවරණය විය.

(v) ඉහත (iii) හි භාරගන්නා ලද සවිකිරීම් කොටස කොන්ත්‍රාත්කරුවන් හතර දෙනෙකුට (4) රු. මිලියන 153.30 ක මුළු කොන්ත්‍රාත් වටිනාකමට ප්‍රදානය කොට තිබුණි. කෙසේ වෙතත් ඉහත සවිකිරීම්වල ඉංජිනේරු ඇස්තමේන්තුව රු. මිලියන 117.92 ක් විය. ඒ හේතුවෙන් රු. මිලියන 35.38 කින් මූලික ඉංජිනේරු ඇස්තමේන්තුව ඉක්මවා වැය දැරීමෙන් කොන්ත්‍රාත්තුව ප්‍රදානය කොට තිබුණි. තවද අමතර වියදම් පරිත්‍යාග නියෝජිතායතන මගින් ප්‍රතිපූර්ණ කර ගැනීමට නොහැකිවීම හේතුවෙන් රජයට සහ ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් දරා ගැනීමට සිදු විය හැකි බව නිරීක්ෂණය විය.

### 4.2.5 උතුරු මහනුවර පාතදුම්බර ඒකාබද්ධ ජල සම්පාදන යෝජනා ක්‍රමය

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) 2015 ජුනි 16 දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. කෙසේ වෙතත් වසර 2 1/2 ක ප්‍රමාදයකින් පසුව 2017 දෙසැම්බර් 22 වන දින ණය ගිවිසුම අත්සන් කර තිබුණි.

(ii) විෂය පථය අඩු කිරීමෙන් පසු (වෙන්කිරීම් සහ මිල විචලතාවයන් හැර) මෙම ව්‍යාපෘති කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු. මිලියන 24,790.24 ක් වූ අතර එය රු. මිලියන 16,169.35 ක් වූ (විෂය පථය අඩු කිරීමට පෙර) මණ්ඩලයේ ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා සියයට 53 ක් ඉක්මවා තිබුණි.

(iii) මණ්ඩලයේ ඉංජිනේරු ඇස්තමේන්තුව අනුව විදේශ ව්‍යවහාර මුදලින් වැය කළ යුතු ඇස්තමේන්තුගත මුදල එක්සත් ජනපද ඩොලර් 26,388,500 ක් විය. කෙසේ වෙතත් විදේශ කොන්ත්‍රාත්කරුගේ කොන්ත්‍රාත් වටිනාකම තුළ ඇතුළත්ව තිබූ වටිනාකම එක්සත් ජනපද ඩොලර් 192,336,418 ක් විය. ඒ හේතුවෙන් විදේශ ව්‍යවහාරයෙන් වැය කිරීමට සැලසුම් කළ වටිනාකම සියයට 629 කින් ඉක්මවා තිබුණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ (5.3.9) (ආ) ඡේදය ප්‍රකාරව, විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් කිරීමට සුදුසුකම් ලැබීම සඳහා ලංසුකරුවන් විසින් එ සම්බන්ධයෙන් සාධාරණීකරණය කිරීමේ කරුණු ඉදිරිපත් කළ යුතු වේ. කෙසේ වෙතත් මණ්ඩලය විසින් පිළියෙල කරන ලද විදේශ වියාවහාර ඇස්තමේන්තු තුළ එවැනි සාධාරණීකරණය කිරීමේ හේතු ලබාගැනීමෙන් තොරව පහත අයිතමයන් ඇතුළත් කර තිබුණි.

| අයිතමය | ඇස්තමේන්තුව තුළ වෙන් කළ වටිනාකම | රේගු ගාස්තු ලෙස වෙන් කළ වටිනාකම |
|---|---|---|
| | එ.ජ.ඩො | රු. |
| කළුගල් කඩා ඉවත් කිරීම | 1,470,033 | 12,905,856 |
| ගස් 27 ක් කැපීම | 229,608 | 2,003,499 |
| ගස් 135 ක මුල් ගැලවීම | 73,080 | 637,425 |

(v) තවද, පවුල් නැවත පදිංචි කිරීමේදී භාවිතා කිරීම සඳහා එක් නිවසක වපසරිය වර්ග මීටර් 483 ක් වන ගෙවල් දෙකක් ඉදිකිරීමට රු. මිලියන 31.92 වටිනාකමක් ඇස්තමේන්තුව තුළ ඇතුළත් කොට තිබුණි.

### 4.2.6 විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) ව්‍යාපෘති අරමුණුවලට පටහැනි ලෙස මණ්ඩලයේ සභාපතිගේ ප්‍රයෝජනය සඳහා ජීප් රථයක් මිලදී ගැනීම පිණිස මණ්ඩලය විසින් සිදු කරනු ලැබූ ඉල්ලීම මත 2016 මාර්තු 18 වන දින කොන්ත්‍රාත්කරු විසින් රු.18,600,000 ක මුදලක් ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කොට තිබුණි. කෙසේ වෙතත් මෙම අරමුදල වාහනය මිලදී ගැනීම සඳහා භාවිතා කර නොතිබුණි. ඒ හේතුවෙන් කොන්ත්‍රාත්කරු විසින් රු. 980,000 ක මුදලක් සහභාගීත්ව ගාස්තු ලෙස අයකරගෙන තිබුණි.

(ii) ආදායම් නොලබන ජලය අඩු කිරීම සඳහා ජල උපාංග පරීක්ෂා කිරීමේ රසායනාගාරයක්, ජලමනු පරීක්ෂා කිරීමේ රසායනාගාරයක් සහ ජල උපකරණ පරීක්ෂාව සඳහා වූ ජල ටැංකි හා උපකරණ පරීක්ෂා කිරීමේ ඒකකයක් ඉදිකොට 2016 පෙබරවාරි 29 වන දින මණ්ඩලය වෙත භාරදී තිබුණි. කෙසේ වෙතත් මෙම ඒකකයන් 2018 ජූලි 31 වන විටත් අපේක්ෂිත අරමුණු සඳහා උපයෝජනය කර නොතිබුණි.

### 4.2.7 යාපනය කිලිනොච්චි ජල සම්පාදන සහ සනීපාරක්ෂක ව්‍යාපෘතිය

පහත නිරීක්ෂණය කරනු ලැබේ.

නාවත්කුලිය ජල කුළුණ හා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීමට රු. මිලියන 3.45 ක මුදලක් 2014 ජුනි 11 වන දින ජාතික නිවාස සංවර්ධන අධිකාරියට ගෙවා තිබුණි. කෙසේ වෙතත් 2017 දෙසැම්බර් 31 දින වන විටත් අත්පත් කරගත් ඉඩම්වල අයිතිය ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට පවරා නොතිබුණි.

### 4.2.8 වියළි කලාපීය නාගරික ජල හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ණය ගිවිසුමේ උපලේඛන 05 හි, 18 වන ඡේදය ප්‍රකාරව නගර සභා විසින් පිරියම් කළ අපද්‍රව්‍යවල ප්‍රමාණය හා ගුණත්වය, අපද්‍රව්‍ය මුදාහරින ජලයේ ගුණත්වය සහ වියළි මලාපවහන අප්‍රද්‍රව්‍යවල අඩංගු බැක්ටීරියාවල ගුණත්වය නිරන්තරව අධීක්ෂණය කළ යුතු ය. කෙසේ වෙතත් කාර්යක්ෂම අපද්‍රව්‍ය කළමනාකරණයක් යටතේ ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක වන ප්‍රදේශයන් තුළ නගර සභා විසින් කාර්යක්ෂම අපද්‍රව්‍ය කළමනාකරණයක් සඳහා වන අධීක්ෂණ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කරන බවට සනාථ කරන කිසිදු සාක්ෂියක් දක්නට නොලැබුණි.

(ii) නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය සහ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් ව්‍යාපෘතියේ කටයුතු සමීපව අධීක්ෂණය කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතු බවට 2005 අප්‍රේල් 05 පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමකදී තීරණය කර තිබුණි. කෙසේ වුවත් 2017 දෙසැම්බර් 31 දින දක්වාත් සුදුසු යාන්ත්‍රණයක් දෙපාර්ශවය විසින්ම ක්‍රියාත්මක කර නොතිබුණි.

(iii) ජලාශ 03 ක් නවීකරණය හා වී වගාව සඳහා පතියාකුලම් හා කට්ටකුලම්හි ඉඩම් වැඩිදියුණු කිරීම සඳහා අවබෝධතා ගිවිසුමක් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ එකඟතාව ලබා ගැනීමකින් තොරව වවුනියාවේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු සහකාර කොමසාරිස් සමඟ ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2014 දී අත්සන් කර තිබුණි. කෙසේ වෙතත් සහකාර කොමසාරිස් ඒ අනුව කටයුතු නොකිරීම නිසා කටයුතු ප්‍රමාද වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පෙර වර්ෂවල වන්දි හා යටිතල පහසුකම් ලෙස රු. මිලියන 21.8 ක් ශ්‍රී ලංකා රජයේ ලැබුණු දායකයෙන් ව්‍යාපෘතියට ගෙවීමට සිදු වී තිබුණි.

(iv) ණය නියෝජිතායතනයේ අනුමැතිය යටතේ ව්‍යාපෘතිය විසින් 2017 මැයි 19 දින උතුරු හා වයඹ පළාතේ ප්‍රාදේශීය සහය සේවා මධ්‍යස්ථානයේ ප්‍රයෝජනය සඳහා රු. මිලියන 16.95 ක පිරිවැයකට මෝටර් රථ 02 ක් මිලට ගැනීමට කටයුතු කර තිබුණි. කෙසේ වුවද, අදාළ වාහන ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමට දායක නොවන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ දකුණු ප්‍රාදේශිකයේ කාර්යාලයේ සේවයේ නියුතු නිලධාරීන්ට වෙන්කර දී තිබුණි.

### 4.2.9 මොණරාගල, බුත්තල ජල සම්පාදන ව්‍යාපෘතිය

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය සහ කොන්ත්‍රාත්කරු අතර 2015 නොවැම්බර් 30 දින ඇතිකරගත් අවබෝධතා ගිවිසුම අනුකූලව යූරෝ 500,000 ක් වටිනා වැඩ උපකොන්ත්‍රාත්තුවක් වශයෙන් කරගෙන යාම සඳහා මණ්ඩලය විසින් භාරගෙන තිබූ අතර එම වෙන්කිරීම්වලින් යූරෝ 400,000 (රු. මිලියන 62.81) ක් පමණක් මණ්ඩලයට ප්‍රේෂණය කොට තිබූ අතර ඉතිරි යූරෝ 100,000 (රු. මිලියන 15.70) ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරීව සහභාගී වීමෙන් තොරව ලාභාන්තිකය සහ පොදු කාර්ය පිරිවැය ලෙස කොන්ත්‍රාත්කරු විසින් සලකා තිබුණි.

### 4.2.10 විසල් දඹුල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) මෙම ව්‍යාපෘතිය 2012 මාර්තු මස 06 දිනෙන් ආරම්භ කොට මාස 30 කින් එනම් 2014 සැප්තැම්බර් 05 දින අවසන් කිරීමට මුලදී සැලසුම් කොට තිබුණද එදිනට ව්‍යාපෘතිය අවසන් කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත්ව තිබුණි. ඒ හේතුවෙන් 2014 සැප්තැම්බර් 06 වන දින සිට 2018 මාර්තු 31 දින දක්වා අවස්ථා 05ක දී මාස 43 ක අතිරේක කාලපරිච්ඡේදයක් සඳහා කාල දිගුවක් ලබා දී තිබුණි. කෙසේ වෙතත් කොන්ත්‍රාත්කරුගේ දුර්වල කාර්ය සාධනය හේතුවෙන් 2018 ජුනි 30 දින වන විටත් කොන්ත්‍රාත්තුව සම්පූර්ණ නොකොට පැවතුණි. කෙසේ වෙතත් එක්සත් ජනපද ඩොලර් මිලියන 199.36 ක් වටිනා පොල්ගහවෙල, පොතුහැර සහ අලව්ව ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘතියේ සහ පන්නල, මාකඳුර සහ කුලියාපිටිය ජල සම්පාදන ව්‍යාපෘතියේ වෙනත් කොන්ත්‍රාත්තු දෙකක් පිළිවෙලින් 2015 නොවැම්බර් 26 දින සහ 2016 දෙසැම්බර් 02 වන දින එම කොන්ත්‍රාත්කරුටම පිරිනමා තිබුණි.

(ii) තවද, මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් රජය විසින් ලබා ගත් ණය වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ණය වාරික සහ පොලිය වශයෙන් රු. මිලියන 1,964.32 ක් සහ රු. මිලියන 677 ක් දරා තිබූ අතර ප්‍රමාද කාලය තුළ ව්‍යාපෘති කාර්යාලය නඩත්තු කිරීම වෙනුවෙන් කාර්ය මණ්ඩල සහ පොදු කාර්ය පිරිවැය ලෙස රු. මිලියන 151 ක වියදමක් 2017 දෙසැම්බර් 31 දිනට අතිරේක ලෙස දරාගැනීමට සිදුව තිබුණි.

**4.3** **ප්‍රමාද ව්‍යාපෘති**

ඉඩම් නිරවුල් කර ගැනීමේ ප්‍රමාදය, පාරිසරික හා නැවත පදිංචි කිරීමේ ගැටළු, ව්‍යාපෘති පිරිනැමීමේ ප්‍රමාදයක්, කොන්ත්‍රාත්කරුන් විසින් සැපයුම්කරන ලද පී.ඊ පයිප්පයන්හි බාල ගුණත්වය යනාදිය හේතුවෙන් විදේශ මූල්‍යාන ව්‍යාපෘති හතක සැලකිය යුතු කාල ප්‍රමාදයක් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තු වටිනාකම | ආරම්භක දිනය | නිම කළ යුතු දිනය | කාල දිගුව | ප්‍රමාද වූ දින ගණන |
|---|---|---|---|---|---|
| | රු. මිලියන | | | | |
| නිමවුම් පාදක මත වන ගෝලීය හවුල් ව්‍යාපෘතිය | 1,559 | 27/12/2011 | 31/12/2015 | 31/12/2017-31/12/2018 | 1095 |
| විසල් දඹුල්ල ජල සම්පාදන යෝජනා ක්‍රමය - අදියර 01 | 9,593 | 06/03/2012 | 05/09/2014 | 06/09/2014-31//03/2018 | 1302 |
| විසල් රත්නපුර ජල සම්පාදන ව්‍යාපෘතිය | 4,493.66 | 24/07/2013 | 24/07/2015 | 24/07/2015-29/02/2016 | 220 |
| විසල් මහනුවර ජලසම්පාදන ව්‍යාපෘතිය | 7,148 | 30/03/2007 | 30/09/2012 | 30/09/2007-20/07/2017 | 1753 |
| මහ කොළඹ අප ජල කළමනාකරණ ව්‍යාපෘතිය | 13,410 | 18/12/2009 | 31/12/2014 | 31/12/2014-31/12/2017 | 1095 |
| වියළි කලාපීය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 19,165 | 13/11/2009 | 30/06/2013 | 30/06/2013-31/12/2018 | 2009 |
| මහ කොළඹ ජල පුනරුත්ථාපන ව්‍යාපෘතිය | 4,785 | 27/11/2007 | 31/01/2012 | 31/01/2012-20/06/2017 | 1965 |
| නැගෙනහිර පළාත් ජල සම්පාදන හා සංවර්ධන ව්‍යාපෘතිය | 7,702.25 | 20/03/2010 | 20/12/2013 | 20/12/2013-31/12/2015 | 741 |
| මහනුවර නගර අපජල කළමනාකරණ ව්‍යාපෘතිය | 17,278 | 03/02/2010 | 10/10/2017 | දිගුවක් ලබා දී නොමැත. | 385 |

**4.4 දේශීය බැංකු ණය ජල සම්පාදන ව්‍යාපෘති**

**4.4.1 මාතර දිස්ත්‍රික් ජල සම්පාදන සම්බන්ධතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාතර දිස්ත්‍රික්කයේ ජල සම්පාදන සම්බන්ධතා 1300 ක් ලබාදීම සඳහා ව්‍යාපෘතිය ආරම්භ කොට තිබුණි.

(ආ) යූ.පී.වී.සි පයිප්ප, සවිකිරීම හා උපාංග සැපයුම් කොන්ත්‍රාත්තුව 2015 මාර්තු 14 දින සම්පූර්ණ කොට තිබූ අතර එමගින් රු. 70,766,819 ක් වටිනා පයිප්ප සහ සවිකිරීම් සපයා තිබුණි. කෙසේ වෙතත් 2014 දෙසැම්බර් 19 දින සිට 2015 ජූලි 01 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ප්‍රදානය කර තිබූ යූ.පී.වී.සි සවිකිරීම් හා උපාංග එලිම් කොන්ත්‍රාත්තුව 2018 අගෝස්තු 31 දින වන විටත් ආරම්භ කර නොතිබුණි.

(ඇ) මිලදී ගත් පයිප්ප සහ සවිකිරීම් ව්‍යාපෘතියේ අරමුණුවලට සම්බන්ධ නොවූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණි.

**4.4.2 මහනුවර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය - අදියර 01 යටතේ නල එලීම**

රු.77,705,705 ක් සහ රු.94,032,235 ක් වටිනා නල එලීම් සඳහා වන කොන්ත්‍රාත් දෙකක් පිළිවෙලින් 2014 සැප්තැම්බර් සහ 2014 දෙසැම්බර් යන මාස වලදී කොන්ත්‍රාත්කරුවකුට ප්‍රදානය කොට තිබූ අතර පිළිවෙලින් 2015 අගෝස්තු සහ 2015 ජූලි මාසවලදී නිම කළ යුතු ලෙස සැලසුම් කොට තිබුණි. කෙසේ වෙතත් 2015 සැප්තැම්බර් 15 වන දින එකතුව රු. 33,677,822 ක් වටිනා අත්තිකාරම් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ නමුදු වසර 2 ක් ඉක්මවා තිබීමෙන් පසුවද මෙම ව්‍යාපෘතීන් සම්පූර්ණ කොට නොතිබුණි.

**4.5 කළමනාකරණ ක්‍රියාකාරකම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාතර හා බණ්ඩාරවෙල යන දිස්ත්‍රික්කයන්හි සුළු හා මධ්‍ය පරිමාණ ජල සම්පාදන සහ අපවහන ව්‍යාපෘතීන් සඳහා රු. මිලියන 235 ක වෙන් කිරීමක් සිදු කර තිබුණි. 2017 දෙසැම්බර් 31 දිනට එයින් රු මිලියන 15.8 ක් හෙවත් සියයට 7 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ආ) නැගී එන කුඩා නගර (සුළු හා මධ්‍ය පරිමාණ) ජල සම්පාදන ව්‍යාපෘතීන් සඳහා රු. මිලියන 500 ක් වෙන් කර තිබුණද, 2017 දෙසැම්බර් 31 දිනට රු මිලියන 271.40 ක් හෙවත් සියයට 54.3 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(ඇ) තවද, ත්‍රිකුණාමල පද්ධති වැඩිදියුණු කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 250 ක් වෙන් කර තිබුණි. කෙසේ වෙතත් එයින් කිසිදු වියදමක් දරා නොතිබුණි.

(ඈ) මාවනැල්ල තොග ගබඩාවේ ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොතිබීම හේතුවෙන්, ගබඩා පරිශ්‍රය ඇතුලත හා ඉන් පිටත කිසිදු ආරක්ෂාවකින් තොරව තොග ගබඩා කොට තිබුණි. තවද ගබඩාවේ තිබූ ජල මීටර වෙයන් විසින් විනාශ කොට තිබුණි.

(ඉ) කෑගල්ල සහ කළුතර ප්‍රදේශයන්හි සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂාවට අනුව පාරිභෝගික පැමිණිලි විසඳීමේ මන්දගාමී ප්‍රගතියක් නිරීක්ෂණය විය.

**4.6** **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

මණ්ඩලයේ දුර්වල ණය සේවා කරන ධාරිතාව හේතුවෙන්, 2014 වර්ෂයට පසුව ආරම්භ කරන ලද ව්‍යාපෘති වෙනුවෙන් ලබාගත් රු. 63,612,471,380 ක් වටිනා හිඟ ණය ශේෂය 2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා රජයේ ස්කන්ධ ගිණුමට මාරු කොට තිබුණි.

**4.7** **නිශ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) නියැදි විගණන පරීක්ෂාවට අනුව එකතු වටිනාකම රු. 304,192,322 ක් වූ ගබඩා 26 කට අදාළ සෙමින් චලනය වන තොග ශේෂය දීර්ඝ කාලයක් තිස්සේ පැවතුණු අතර එය එම ගබඩා තොග ශේෂයන් සියයට 40 ක් නියෝජනය කරනු ලබයි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට තොගවල රු.539,183,367 ක් වටිනා චලන නොවන තොග හා රු. 467,494,774 ක් වටිනා සෙමින් චලනය වන තොග පැවති අතර එය මණ්ඩලයේ මුළු තොග වටිනාකමින් සියයට 7 ක් හා සියයට 6 නියෝජනය කරනු ලබයි.

(ඇ) විසල් මහනුවර ජල සම්පාදන ව්‍යාපෘතිය සඳහා රසායනාගාර ඉදිකිරීම වෙනුවෙන් රු. 166,993,899 ක් වැය කිරීමෙන් පසුව බඳවා ගැනීමේ පැවති දුර්වලතා හේතුවෙන් ව්‍යාපෘතිය අතහැර දමා තිබුණි.

(ඉ) හපුගල ජල පිරිපහදු පිරියත ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේදී රු. මිලියන 16 ක් වැය කොට විසල් ගාල්ල ජල සම්පාදන ව්‍යාපෘතිය විසින් ඉඩමක් අත්පත් කරගෙන තිබූ අතර ඉඩම අත්පත් කර ගැනීමෙන් පසුව විශාල ගලක් මතුවීම හේතුවෙන් එම ඉඩම අපේක්ෂා කරන ලද අරමුණ සඳහා යොදවා නොතිබුණි.

**4.8** **මතභේදයට තුඩුදෙන කරුණු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට වූ රු. 352,151,303 ක් වටිනා මාර්ගස්ථ තොගයෙන් රු.35,713,013 ක් වටිනාකමැති තොගයක් වසර දෙකකට වඩා වැඩි කාලයක් විමර්ශනය කිරීමකින් තොරව මාර්ගස්ථ තොග වශයෙන් පැවතුණි.

(ආ) තොග සමීක්ෂණයට පෙර තොග ලැබීම් හා නිකුත් කිරීම් තොග ශේෂයට ගැලපිය යුතු වුවද, එකතුව රු.521,015,622 ක් වූ ශුද්ධ හර ශේෂයක් හා එකතුව රු.284,249,255 ක් වූ ශුද්ධ බැර ශේෂයක් තොග සමීක්ෂණයෙන් පසුව තොග ශේෂයට ගලපා තිබුණි.

(ඇ) මණ්ඩලය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය අවසානයට වාහන 11 ක් නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණි. කෙසේ වෙතත් PA-8942, PE-5461, හා PC-5865 අංක දරණ වාහන 3ක් පමණක් අමාත්‍යාංශය වෙත ලැබුණු බව නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් මා වෙත දැනුම් දී තිබුණි.

(ඈ) ණයගැති රැස් කිරීම් පාලන ගිණුමෙහි 2017 දෙසැම්බර් 31 දිනට එකතු වටිනාකම රු.1,244,968,958 ක හර ශේෂයක් නිරීක්ෂණය විය.

## 4.9 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් ආයතනයේ සම්පත්

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍ර ලේඛයේ ඡේද අංක 8.3.9 හි විධිවිධානයට පටහැනිව 2017 දෙසැම්බර් 31 දිනට සේවකයින් 71 දෙනෙකු රේඛීය අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණු අතර 2015 දෙසැම්බර් සිට 2017 දෙසැම්බර් 31 දක්වා එම සේවකයන්ගේ වැටුප් ලෙස රු.87,840,261 ක් මණ්ඩලය විසින් ගෙවා තිබුණි. කෙසේ වෙතත් ඉහත සේවකයින්ගෙන් 28 දෙනෙකු පමණක් අමාත්‍යාංශයේ රාජකාරි සඳහා ක්‍රියාකාරී ලෙස දායක වී තිබුණි. තවද මණ්ඩලය විසින් එම සේවකයන් සඳහා ගෙවූ වැටුප් අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ආ) ඉහත සඳහන් සේවකයින් අතරින්, සේවකයින් 40 දෙනෙකු සම්බන්ධීකාරකවරුන් වශයෙන් කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණි. කෙසේ වෙතත් සම්බන්ධීකාරක තනතුර මණ්ඩලයේ අනුමත කාර්යමණ්ඩලය තුළ නොවීය.

(ඇ) තවද, 2017 ජනවාරි සිට දෙසැම්බර් දක්වා වූ කාල පරිච්ඡේදය තුළ මෝටර් රථ 11 ක් රේඛීය අමාත්‍යාංශය වෙත මුදාහැර තිබුණු අතර එම වාහනවල අලුත්වැඩියා හා බලපත්‍ර ගාස්තුව ලෙස රු. 1,093,567 ක මුදලක් දරා තිබුණි.

## 4.10 සේවක මණ්ඩල කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරුවන් / ඉංජිනේරු (යාන්ත්‍රික) , ඉංජිනේරු (විදුලි) , ඉංජිනේරු (සිවිල්) , මධ්‍යම මට්ටමේ තාක්ෂණික ( එම් එල් - ටී) , ලිපිකරුවන් හා සමාන්තර ශ්‍රේණි වර්ගයන් සහ වෙනත් පුහුණු ශ්‍රේණි ආදි ප්‍රධාන මෙහෙයුම් මට්ටමේ තනතුරු වල පැවති පුරප්පාඩු 817 ක් පිරවීම සඳහා සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම මණ්ඩලය විසින් පියවර ගෙන නොතිබුණි.

(ආ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කලමණාකරන සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දක්වා ඇති පරිදි බඳවා ගැනීම් හා උසස්වීම් පටිපාටිය සඳහා කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව 2000 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා විවිධ කාර්ය මණ්ඩල වර්ගීකරණයන්ට අයත් සේවකයින් 140 දෙනෙකු විදේශ මූල්‍යන ජල සම්පාදන හා අපවහන ව්‍යාපෘති සඳහා නිදහස් කොට තිබුණි. මණ්ඩලය විසින් ගෙවන ලද වේතන හා අනෙකුත් දීමනා එම ව්‍යාපෘතීන් විසින් මණ්ඩලය වෙත ප්‍රතිපූර්ණය කොට තිබුණි. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරුන් 02 ක්, සහකාර සාමාන්‍යාධිකාරීන් 18 ක්, ප්‍රධාන ඉංජිනේරුවන් 28 ක්, ඉංජිනේරුවරුන් 41 ක්, සහකාර ඉංජිනේරුවරුන් 40 ක්, සමාජ විද්‍යාඥයින් 03 දෙනෙකු ඒ අතර විය.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට සේවකයින් 223 දෙනෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන තිබුණු අතර සිවිල් ඉංජිනේරුවරයෙකු සහ ප්‍රමාණ සමීක්ෂකවරයෙකු ද ඒ තුළ විය.

(ඉ) 2015 වර්ෂයේදී බහුවිධ කාර්යස්ථ පුහුණුව සඳහා සේවකයින් 508 දෙනෙකු භාණ්ඩාගාර ලේකම්ගේ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව බඳවාගෙන තිබුණු අතර 2016 වර්ෂය තුළදී ඔවුන්ගෙන් සේවකයින් 491 දෙනෙකු සේවයෙහි ස්ථිර කොට තිබුණි. තවද 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ඔවුන්ගේ වැටුප් ලෙස රු.මිලියන 563.5 ක් ගෙවා තිබුණි.

(ඊ) ඉහත සඳහන් පරිදි බඳවා ගන්නා ලද සේවක සංඛ්‍යාවට අමතරව සේවා කොන්ත්‍රාත් ගිවිසුම් මත සේවකයින් 1,628 දෙනෙකු මණ්ඩලය තුළ සේවයෙහි යොදවා තිබුණු අතර 2017 වර්ෂය සඳහා ඔවුන් වෙනුවෙන් රු. මිලියන 449 ක් ගෙවා තිබුණි.

**4.11 දූෂණ අක්‍රමිකතා**

---------------------

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලබයි.

(අ) ත්‍රිකුණාමලය, කැලණිය, අම්පාර ප්‍රදේශයන්හි 1999 සිට 2006 දක්වා කාල පරිච්ඡේදය තුළ සිදු කරන ලද රු.මිලියන 246.66 ක මුදල් වංචාවන් වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීම සඳහා 2017 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

(ආ) කළුතර ප්‍රාදේශිකයේ මනුසටහන්කරුවෙකු විසින් 2017 වර්ෂය තුළ සිදු කරන ලද රු.1,145,235 ක් වටිනා වංචාව, වගකිව යුතු පුද්ගලයන්ගෙන් අයකර ගැනීමට 2018 අගෝස්තු 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**5. තිරසාර සංවර්ධන අරමුණු කරා ලඟා වීම**

-----------------------------------------------

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අරමුණු න්‍යාය පත්‍රය, 2030 පිළිබඳව දැනුවත් වීමෙන් අනතුරුව, 2030 වර්ෂයේදී විශ්වීය හා සාධාරණ ලෙස සැම දෙනාටම ආරක්ෂිත හා දැරිය හැකි ලෙස පානීය ජලය සඳහා ප්‍රවිෂ්ඨය සහ ප්‍රමාණවත් සහ සාධාරණ ලෙස සනීපාරක්ෂක පහසුකම් සඳහා ප්‍රවිශ්ඨය ලබා දීම සහ විශේෂ අවශ්‍යතා ඇති කාන්තා හා ගැහැණු ළමුන්ගේ අවශ්‍යතා සඳහා විශේෂ අවධානය යොමු කිරීම යනාදිය තිරසාර සංවර්ධණ අරමුණු ලෙස මණ්ඩලය හඳුනාගෙන තිබුණි. කෙසේ වෙතත් මණ්ඩලයේ විෂය පථයට යටත්වන වෙනත් අරමුණු, ඉලක්ක සහ සන්දිස්ථානයන් හඳුනා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. තවද, තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා මණ්ඩලය විසින් අභ්‍යන්තර චක්‍රලේඛ හෝ මග පෙන්වීම් නිකුත් කර නොතිබුණි.

**6. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය**

-------------------------------------------

**6.1 අභ්‍යන්තර විගණනය**

--------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සහකාර සාමාන්‍යාධිකාරීවරයෙකු, ප්‍රධාන අභ්‍යන්තර විගණකවරු 05 දෙනෙකු, අභ්‍යන්තර විගණකවරු තුන්දෙනෙකු සහ ඉංජිනේරුවරයෙකු ඇතුළුව අභ්‍යන්තර විගණන අංශයේ පුරප්පාඩු 16 ක් පැවතුනි.

(ආ) දේශීය සහ විදේශීය අරමුදල් භාවිතා කරන ජල සම්පාදන හා සනීපාරක්ෂක සේවා ව්‍යාපෘතීන් විශාල ප්‍රමාණයක් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරමින් පැවතියද, මණ්ඩලයේ තාක්ෂණික විගණන අංශය සඳහා ප්‍රමාණවත් සේවක මණ්ඩලයක් අනුයුක්ත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘති ක්‍රියාකාරකම් කිහිපයක් සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**6.2 ප්‍රසම්පාදන සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය**

**6.2.1. ප්‍රසම්පාදනයන්**

පහත නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(අ) රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්හි ඡේද අංක 4.2.1 (අ) ප්‍රකාරව මණ්ඩලය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ මිලදීගත් රු. මිලියන 39 ක් වටිනා පරිගණක 370 ක් 2017 වර්ෂය සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්ම තුළ ඇතුළත් කොට නොතිබුණි.

(ඇ) 2017 වර්ෂය වෙනුවෙන් පිළියෙල කරන ලද විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම සඳහා අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතිය ලබා ගෙන නොතිබුණි.

(ඈ) ප්‍රසම්පාදන සැලැස්ම කාලීනව සමාලෝචනය කොට යාවත්කාලීන කර නොතිබුණි.

(ඉ) විගණනය විසින් සිදුකරන ලද නියැදි විගණන පරීක්ෂාව අනුව ප්‍රදාන ලිපිවල ඇතුළත් විධිවිධානයන්ට අනුකූලව ඇතැම් අවස්ථාවන්හිදී ඇවර කිරීමේ අලාභ සැපයුම්කරුවන්ගේ අය කරගෙන නොතිබුණි.

**7. අයවැය පාලනය**

අයවැය ඵලදායී කලමනාකරණ පාලන උපකරණයක් ලෙස යොදාගෙන නොතිබු බව පෙන්වාදෙමින් අයවැය ගත හා සත්‍ය ආදායම් හා වියදම් අතර සියයට 11 සිට සියයට 57 දක්වා වු සැලකිය යුතු විචලතාවයන් නිරීක්ෂණය විය.

**8. පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දූර්වලතා මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පාලන ක්ෂේත්‍රය | නිරීක්ෂණය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | පාලන ගිණුම්, කෙරීගෙන යන වැඩ හා අන්තර් දෙපාර්තමේන්තු දත්ත ගිණුම්කරණ දත්ත සමඟ සැසඳීමට අපොහොසත් වීම. |
| (ආ) | වත්කම් කළමනාකරණය | (i) විවිධ ප්‍රාදේශිකයන්හි එකම ස්ථාවර වත්කම් දෙවරක් සටහන් කිරීම.<br>(ii) ස්ථාවර සහ අස්පෘශ්‍ය වත්කම් වටිනාකම සමාලෝචනය හා නැවත නොදැක්වීම.<br>(iii) ව්‍යාපෘති නිමකර තිබුණද, ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබීම.<br>(iv) දිගු කාලයක් සඳහා නොවෙනස්ව පැවති කෙරිගෙන යන වැඩ ශේෂ විමර්ශනය කිරීමට අපොහොසත් වීම.<br>(v) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ නියමිත කාලය තුළ සම්පූර්ණ කිරීමට අපොහොසත් වීම. |

| | | |
|---|---|---|
| | | (vi) වෙනත් ආයතන වෙත වාහන නිදහස් කිරීම.<br>(vii) ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භයට පෙර ඉඩම් අත්පත් කර ගැනීමට අපොහොසත් වීම. |
| (ඇ) | තොග පාලනය | (i) භෞතිකව සත්‍යාපනය කරන ලද ශේෂ ලෙජර ශේෂයන් සමඟ සන්සන්දනය නොකිරීම.<br>(ii) මාර්ගස්ථ තොග ශේෂයන් සහ චලනය නොවන සහ සෙමින් චලනය වන තොග ගබඩාවන්හි දීර්ඝ කාලීනව පැවතීම.<br>(iii) ඒකාබද්ධ තොග පාලන පද්ධතියක් නඩත්තු කිරීමට අපොහොසත් වීම.<br>(iv) අධික ලෙස අමුද්‍රව්‍ය ප්‍රසම්පාදනය කිරීම.<br>(v) කිසිදු ආරක්ෂාවකින් සහ ප්‍රමාණවත් ඉඩපහසුකම් නොමැතිව ගබඩා තුළ ද්‍රව්‍ය ගබඩා කිරීම. |
| (ඈ) | ව්‍යාපෘති පරිපාලනය හා කාර්යසාධන සමාලෝචනය | (i) අපේක්ෂිත කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘති නිමකිරීමට අපොහොසත්වීම සහ වලංගු හේතූන් නොමැතිව ව්‍යාපෘති කාලය දීර්ඝ කර ගැනීම.<br>(ii) ශක්‍යතා අධ්‍යයනයන් ක්‍රමවත්ව සිදුකරීමේ නොහැකියාව.<br>(iii) රාජ්‍ය ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූල නොවීම.<br>(iv) කාලය දීර්ඝ කිරීම හා අරමුදල් උපයෝජනයේ දුර්වලතා හේතුවෙන් පිරිවැය අධික ලෙස ඉහල යාම.<br>(v) ඉංජිනේරු ඇස්තමේන්තුව, කොන්ත්‍රාත් වටිනාකම සමඟ විශාල ලෙස විචලනයන් සහිතව කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම. |
| (ඉ) | නැවත අයකළ හැකි යෝජනාක්‍රම ගිණුම්කරණය | නැවත අයකළ හැකි යෝජනා ක්‍රම සඳහා ලද අත්තිකාරම් අදාළ වියදමට එරෙහිව කපා දැමීමෙන් තොරව දීර්ඝ කාලයක භාරයේ තබාගැනීම. |
| (උ) | කාර්ය මණ්ඩල කළමනාකරණය | (i) අවශ්‍ය කරන අධිකාරීන් නොමැතිව මානව සම්පත් වෙනත් ආයතන වෙත නිදහස් කිරීම.<br>(ii) මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගැනීමෙන් තොරව සේවකයින් බඳවා ගැනීම.<br>(iii) ව්‍යාජ සහතික පත්‍ර මත පදනම්ව සේවක උසස්වීම් ලබා දීම.<br>(iv) සේවකයන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගැනීමේ ප්‍රමාදය. |